සැ.යු .- 2015.10.16 දින පළ වූ අංක 1937 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,938 - 2015 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2015.10.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 686 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 686 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 377

DVF/RECT/284/01/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බල සේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන් හි සිට තාවකාලික මේජර් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) කපිතන් මාධව ප්‍රසන්න අබේගුණසේකර, ශ්‍රීලංජාආබමු (නි/5309) - 2010.12.01
(ආ) කපිතන් සීක්කු බදුගේ තිලංක ප්‍රදීප් ද සිල්වා, ඉසේබ (නි/6484) - 2014.12.01
(ඇ) කපිතන් උඩුගල්පිටිය එදිරි තන්ත්‍රිගේ මංජුල ප්‍රසන්න උඩුගල්පිටිය, ශ්‍රීලංජාආබමු (න/5894) - 2011.06.30
(ඈ) කපිතන් වීරසේකර ආරච්චිගේ දොන් චම්පික ක්‍රිෂාන්ත, ශ්‍රීලංජාආබමු (නි/5906) - 2011.06.30
(ඉ) කපිතන් අලුත් ගෙදර නිමල් ධනසිරි ශ්‍රීලපාහ (නි/5953) - 2014.12.01
(ඊ) කපිතන් රංජන සමරනායක සබුබ (නි/6205) - 2014.12.01
(උ) කපිතන් දුමින්ද ශ්‍රී උපමාල් ජයමාන්න, ආර්එස්පී ගරෙ (නි/6211) - 2014.12.01
(ඌ) කපිතන් තන්ත්‍රීගේ නාලක පෙරේරා, ශ්‍රීලංරබ (නි/6213) - 2013.01.06
(එ) කපිතන් ප්‍රසන්න ගුණවර්ධන, ශ්‍රීලංජාආබමු (නි/6076) - 2013.06.28
(ඒ) කපිතන් කොහොවිල ආරච්චිලාගේ ප්‍රියන්ත බණ්ඩාර, ශ්‍රීලංජාආබමු (නා/6079) - 2014.12.01
(ඔ) කපිතන් මේනක දුෂාන්ත සිල්වා අමරසිංහ, ශ්‍රීලපාහ (නි/6089) - 2013.06.28
(ඕ) කපිතන් කුසුමින්ද චානක යාපාරත්න, ශ්‍රීලංසිරෙ (නි/6149) - 2014.12.01
(ක) කපිතන් හෙට්ටියාවත්තේ ආරච්චිලාගේ ජගත් නිශාන්ත කුමාර හෙට්ටිආරච්චි, ශ්‍රීලංරබ (නි/6155) - 2014.12.01
(ග) කපිතන් කලුගලගේ අමිල රවීන්ද්‍ර, ශ්‍රීලයුපුබ (නි.6160) - 2013.12.20
(ච) කපිතන් ලේකම් රාලලාගේ ඉන්දික දුෂ්යන්ත බණ්ඩාර, ශ්‍රීලංසිරෙ (නි/6163) - 2013.12.20
(ජ) කපිතන් සන්දරා මරක්කල ලසන්ත ලක්මාල් ද සිල්වා, ගැහේබ (නි/6165) - 2014.12.01
(ට) කපිතන් මුතුකුඩ ආරච්චිලාගේ දිනේෂ් කුමාර, ශ්‍රීලංජාආබමු (නි/6191) - 2014.06.25
(ඩ) කපිතන් මඩවල කුලතුංග මුදලිගේ රංජන දේශප්‍රිය, විපාරෙ (නි/6192) - 2014.06.25
(ණ) කපිතන් හෙට්ටිආරච්චිල්ලාගේ පණ්ඩුල සූරිය මංගල බණ්ඩාර හෙට්ටිආරච්චි, ශ්‍රීලංසිරෙ (නි/6461) - 2014.12.18
(ත) කපිතන් වටවල කංකානමලාගේ ධනුෂ්ක ඉන්ද්‍රජිත් රත්නපාල, ශ්‍රීලංජාආබමු (නි/6462) - 2014.12.18
(ද) කපිතන් වික්‍රමසිංහ හීන්කෙන්දගේ රවීන්ද්‍ර කරුණාරත්න, ශ්‍රීලයුපොදුසේබ (නි/5947) - 2015.01.13
(න) කපිතන් මාරසිංහගේ තමීර ඉසේබ (නි/8320) - 2015.02.16

අතිගරු ජනාධිපතිඋතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10 - 866

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක යූනියන් බැංකුව වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 අගෝස්තු මස 28 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වරකාපොල නාවුගල අංක 17/2 දරන ස්ථානයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 6426211840v හිමි) මිහිරිගමගේ පියල් කීර්ති රණසිංහ නොහොත් මීරිගමගේ පියල් කීර්ති රණසිංහ නොහොත් මිරිගමගේ පියල් කීර්ති රණසිංහ සහ (ජාතික හැඳුනුම්පත් අංක 718134722v හිමි) ගොඩයලගේ ප්‍රියංකා සේනාරත්න (මෙහි මින්මතු ඇතැම් තැනක උකස්කරුවන් වශයෙන් හඳුන්වනු ලබන) යන අය විසින් යූනියන් බැංකුව වෙතින් වාර ණය පහසුකමක් ලබාගෙන ඇති බැවින් ද, එකී පහසුකම නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් හැත්තෑ ලක්ෂයක (රු. 70,00,000) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරුවන් විසින් කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. වික්‍රමනායක විසින් සහතික කරන ලද අංක 1810 සහ 2014.08.27 වැනි දින දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී ණය පහසුකම් නිසා 2015.06.11 වැනි දිනට රුපියල් හැටහත්ලක්ෂ පනස්හයදහස් එකසිය දහතුනකුත් ශත දහහතරක (රු. 67,56,113.14) මුදල සහ ඒ මත 2015.06.12 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වාර්ෂික පැහැර හරින ලද පොළිය ද එකී උකස්කරුවන් වෙතින් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය එකී උකස්කරුවන් විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදු කර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය

ප්‍රකාරව ක්‍රියා කරමින්, රුපියල් හැටහත්ලක්ෂ පනස්හයදහස් එකසිය දහතුනකුත් ශත දහහතරක (රු. 67,56,113.14) මුදල සහ ඒ මත 2015.06.12 වැනි දින සිට වාර්ෂික පැහැර හරින ලද පොළිය ද තව ද, ඉහත කී අංක 1810 සහ 2014.08.27 දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළු ම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. වික්‍රමනායක විසින් සහතික කරන ලද අංක 1810 දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රදාවඩුන්න ග්‍රාම නිලධාරි වසමේ රදාවඩුන්නේ පිහිටි, ''දෙල්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. යාපා විසින් මැන සාදන ලද අංක 3385 සහ 2010.10.19 වැනි දින පිඹුරේ නිරූපිත කැබලි අංක A නමැති බෙද වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : ප්‍රධාන පාර සහ කැබලි අංක D හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : කැබලි අංක D හි ඉතිරි කොටස සහ ප්‍රධාන පාර ද, දකුණට : අංක 726 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 10 ද, බස්නාහිරට : අංක 726 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 10 සහ 5 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්පහක් (අ.0, රූ. 0, පර්. 35) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේ ද සමගය. මෙම දේපළ H 117/55 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,

10 - 770

---

**යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු ඇතැම් තැනක යූනියන් බැංකුව වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 අගෝස්තු මස 28 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වරකාපොල නාවුගල අංක 17/02 දරන ස්ථානයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 6426211840v හිමි) මීහිරිගමගේ පියල් කීර්ති රණසිංහ නොහොත් මීරිගමගේ පියල් කීර්ති රණසිංහ නොහොත් මිරිගමගේ පියල් කීර්ති රණසිංහ (මෙහි මින් මතු ඇතැම් තැනක උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) යන අය විසින් යූනියන් බැංකුව වෙතින් බැංකු පහසුකමක් ලබාගෙන ඇති බැවින් ද, එකී පහසුකම නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් පනස්ලක්ෂයක (රු.50,00,000) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. වික්‍රමනායක විසින් සහතික කරන ලද අංක 1757 සහ 2014.03.27 වැනි දින දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී ණය පහසුකම් නිසා 2015.06.11 වැනි දිනට රුපියල් පනස්ලක්ෂ අනූනවදහස් අටසිය විසිඅටකුත් ශත නවයක (රු. 50,99,828.09) මුදල සහ ඒ මත 2015.06.12 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වාර්ෂික පැහැර හරින ලද පොළිය ද එකී උකස්කරු වෙතින් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය එකී උකස්කරු විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදු කර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, රුපියල් පනස්ලක්ෂ අනූනවදහස් අටසිය විසිඅටකුත් ශත නවයක (රු..50,99,828.09) මුදල සහ ඒ මත 2015.06.12 වැනි දින සිට වාර්ෂික පැහැර හරින ලද පොළිය ද තව ද, ඉහත කී අංක 1757 දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද අය කර ගැනීම සඳහා කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. වික්‍රමනායක විසින් සහතික කරන ලද අංක 1757 සහ 2014.03.27 වැනි දින දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරය දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහපත්තුවේ මීරිගම ප්‍රාදේශීය සභා සීමාවේ සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාවුගල ග්‍රාම නිලධාරි වසමේ නාවුගල පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් මැන සාදන ලද අංක 4254 සහ 2014.02.03 වැනි දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 දරන බෙද වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා ද, දකුණට : මරගහකොටුවද, බස්නාහිරට : පන්සලේවත්ත ද, යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් තිස්අටකුත් දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 38.15) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේ ද සමග ය.

ඉහත කී ඉඩම වනාහි පහත විස්තර කරන ඉඩමේ නැවත මැන බෙදීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, නාවුගල පිහිටි, සියඹලාගහවත්ත කොටසේ කැබලි අංක 11 කැබලි අංක ඒ නමැති බෙද වෙන් කළ ඉඩමට මායිම් උතුරට සහ නැගෙනහිරට : ගම්සභා පාර ද දකුණට : එච්. පොඩියා සහ තවත් අයගේ කුඹුර ද බස්නාහිරට : ඉඩමේ වෙන් කරන ලද කොටසේ මායිම් ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේද සමඟ ය. මෙම දේපළ එෆ් 138/125 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,

10 - 771

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2015.09.09 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් එස්. රණසිංහ විසින් සහතික කරන ලද 2014.11.28 දිනැති අංක 372 දරන උකස් බැඳුම්කරයට අනුව 2015.07.22 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි හාරලක්ෂ අසූහත් දහස් හාරසිය අසූහයයි ශත හැට දෙකක (රු. 1,04,87,486.62) මුදල සමඟ රුපියල් අනූඅට ලක්ෂ හැටඅටදාහක (රු. 98,68,000) මුදල මත වසකරට සියයට දහතුනක (13%) බැගින් පොලියක් 2015.07.23 වැනි දින සිට ගෙවීම නිම කරන දිනයතෙක් පානදුර, ගොරකාන, ගාලු පාරේ, අංක 306 හි නාම්මුනි කමල් නිශාන්ත ද සොයිසා මහතා (තනි අයිතිකරු මොරටුව, රාවතාවත්ත, ගාලු පාරේ, අංක 457/1 ඒ හි අකුරල හාඩ්වෙයාර් ස්ටෝර්ස්) වෙතින් අයවිය යුතුව ඇත.

2014.11.28 දිනැති එකී අංක 372 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි හාරලක්ෂ අසූහත් දහස් හාරසීය අසූහයයි ශත හැට දෙකක (රු.1,04,87,486.62) මුදල සමඟ 2015.07.23 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥ පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, කටුබැද්ද ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 557 ඒ දරන මොරටුව නගර සභා සීමාවේ රාවතාවත්ත (බටහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රාවතාවත්තෙහි පිහිටි ''බුලුගහවත්ත දැනට මෙන්ඩිස්විලා'' ලෙස ප්‍රසිද්ධ ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ජී. එස්. පෙරේරා විසින් සාදන ලද 1986 ජුනි මස 06 දිනැති අංක 2138 දරන (එහෙත් 2135 ලෙස ලියාපදිංචි ඇති) පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට ලොට් 1 සහ එම ඉඩමේම ලොට් 1 ඒ ද, නැගෙනහිරට කොළඹ ගාල්ල ප්‍රධාන පාර ද, දකුණට අංක 2138 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට එම ඉඩමේම ලොට් 1 සහ 5 ද මායිම්ව එකී අංක 2138 දරන පිඹුරට අනුව පර්චස් දෙකක (අ. 0, රූ. 0, පර්. 2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි D 144/125 හි ලියාපදිංචි කර ඇත.

2. එකී රාවතාවත්තෙහි පිහිටි දැනට ''මෙන්ඩිස්විලා'' ලෙස ප්‍රසිද්ධ බුළුගහවත්ත නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද ඇතුළත් වූ අංක 2138 (එහෙත් 1986 ජුනි මස 6 දිනැති අංක 428 ලෙස ලියාපදිංචි) දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට එකී අංක 2138 දරන පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට කොළඹ ගාල්ල ප්‍රධාන පාරද, දකුණට ලොට් 3 ඒ ද, බස්නාහිරට එම ඉඩමේ ලොට් 5 ද මායිම්ව අංක 2138 දරන පිඹුර ප්‍රකාර පර්චස් දෙකයි දශම පහයි පහක (අ. 0, රූ. 0, පර්. 2.55) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 144/126 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

යූ. ආර්. පී. පෙරේරා,
කළමනාකාරිණි.

ලංකා බැංකුව,
කටුබැද්ද.

10 - 810

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2015.09.09 වෙනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහතික කරන ලද 2010.05.24 දිනැති අංක 1240 සහ 1241 දරන උකස් බැඳුම්කර අනුව ණය මත 2015.08.09 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි නව ලක්ෂ හැට අටදහස් අටසිය විසි අටයි ශත හතලිස් අටක (රු. 1,09,68,828.48) මුදල සමඟ රුපියල්

හැත්තෑ එක් ලක්ෂ පනස් හත් දහස් පන්සිය තිස් නවයයි ශත පනස් එකක (රු. 71,57,539.51) මුදල මත වසරකට සියයට දහතුන (13%) බැගින් 2015.06.06 වැනි දින සිට ගෙවීම් නිම කරන දිනය තෙක් පොලියක් ද, ඇපකර ලිපි පහසුකම මත 2015.08.09 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් තිස්හතර ලක්ෂ හැටහය දහස් පන්සිය දහඅටයි ශත අනූව (රු. 34,66,518.90) ක මුදල සමඟ රුපියල් විසිලක්ෂ හැත්තෑ නවදාහක (රු. 20,79,000.00) මුදල මත වසරකට සියයට විසිහතර (24%) බැගින් 2015.08.10 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොලියද බණ්ඩාරගම, වල්ගම පාසල ඉදිරිපිට අංක 93 E හි දැනට පිහිටා ඇති කැස්බෑව, බණ්ඩාරගම පාරේ, අංක 228/11 හි සෙනුත් බජාජ් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (බණ්ඩාරගම, වල්ගම, ''පුබුදු'' හි විතානගේ දොන් බුද්ධදාස මහතා, බණ්ඩාරගම, වල්ගම, අංක 116 හි දොඹගහවත්තගේ සමන්ත තුෂාර ජයසිරි මහතා සහ විතානගේ දුලාංජී මිය අධ්‍යක්ෂවරු වෙති) වෙතින් අයවිය යුතුව ඇත.

2. 2010.05.24 දිනැති එකී අංක 1240 සහ 1241 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි නව ලක්ෂ හැට අටදහස් අටසිය විසි අටයි ශත හතලිස් අටක (රු. 1,09,68,828.48) මුදල සමඟ රුපියල් තිස්හතර ලක්ෂ හැටහය දහස් පන්සිය දහඅටයි ශත අනූව (රු. 34,66,518.90) බැගින් 2015.08.10 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, බණ්ඩාරගම ශාඛාවේ කළමනාකාරිණිය හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ, රයිගම් කෝරළේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 667 බී දරන ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ ගම්මන්පිල පිහිටි ''වල්ගම්කැලේ නොහොත් දෙළලන්ද'' නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් සාදන ලද 1988 මැයි මස 01 දිනැති අංක 1938 දරන පිඹුරෙහි ලොට් 7A ලෙස දක්වා සීමා නිර්ණය කොට, නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 7 A උතුරටː ඇල්බට් කරුණාරත්න උරුමකම් කියන ඉඩමද, පිඹුරු අංක 1642 හි ලොට් 8 ද, නැගෙනහිරට : වීදගම සිට වීදියගොඩ දක්වා ප්‍රධාන පාර ද, දකුණට : අංක 1987 දරන පිඹුරෙහි ලොට් 7B ද, බස්නාහිරට : අංකුටුවලදෙණිය ඕවිටද මායිම්ව එකී අංක 1987 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි, පර්චස් එකොළහයි දශම නවයක (අ. 0, රූ. 2, පර්. 11.9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 168/69 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රමගේ විසින් මෑතක දී මැන සාදන ලද 2005 පෙබරවාරි 06 වැනි දිනැති අංක 198/2006 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී ගම්මන්පිල පිහිටි ''වල්ගම්කැලේ'' නොහොත් ''දෙළලන්ද'' නමැති ඉඩමේ එහි ඇති ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියලු දේද ඇතුළත් වූ අංක 198/2006 දරන එකී පිඹුරෙහි ලොට් 7 A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 7 A උතුරට : ඇල්බට් කරුණාරත්න සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම සහ බලයලත් මිනින්දෝරු එම්. ඩී. එස්. ගුණතිලක විසින් සාදන ලද අංක 1642 දරන පිඹුරෙහි ලොට් 8 ද, නැගෙනහිරට : මහා මාර්ගය ද, දකුණට : ඩී. එච්. ඇතුළත්මුදලි විසින් සාදන ලද අංක 1987 දරන පිඹුරෙහි ලොට් 7A ද, බස්නාහිරට : අංකුටුවලදෙණිය ඕවිට ද මායිම්ව එකී අංක 198/2000 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම නවයක (අ. 0, රූ. 2, පර්. 11.9) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. ඒ. ඩී. පී. රණසිංහ මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
බණ්ඩාරගම.

10 - 811

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015ක් වූ මාර්තු මස 23 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් බී. කේ. සූරියආරච්චි මහත්මිය විසින් සහතික කරන ලද වර්ෂ 2011.08.08 දිනැති අංක 436 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, වැලිගම දරන ස්ථානයේ "වියන මැරීන්" යන නාමය විලාශය සහ ආයතනය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන වැලිගම දරන ස්ථානයේ පදිංචි කලුහැන්නැදිගේ නිහාල් නන්දන ද සිල්වා (ණයට ගන්නා) විසින් පැහැර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2015ක් වූ ජනවාරි මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවෙන් රුපියල් පනස්නම ලක්ෂ අනූහත්දහස් හයසිය විසි අටයි ශත තිස් හත (රු. 59,97,628.37) ක මුදලක් අයවිය යුතුය හා ණයව පවතින බැවින් ද,

සංශෝධිත 1990 අංක 4 දරන බැකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් පනස්නම ලක්ෂ අනූහත්දහස් හයසිය විසි අටයි ශත තිස් හත (රු. 59,97,628.37) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2015 පෙරවාරි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් ලක්ෂය (රු. 50,00,000.00)ක මුල් මුදල මත වසරකට සියයට දාසයයි දශම පහ (16.5%)ක පොළිය ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට වන වියදම්ද ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත I සහ II වන කොටස්වල විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රයන් ඇතුළුව නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු වූ. පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### උගස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

I වන කොටස - දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, වැලිගම මහනගර සභා සීමාව තුළ හෙට්ටිවීදිය දරන ස්ථානයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 2007.02.14 වැනි දින අංක 2074 දරන පිඹුරේ ලොට් A ලෙස දැක්වෙන, ලොට් 3 සහ 11 දරන කොටස් ඒකාබද්ධ වූ අලුත්තනගේවත්ත යන නමින් හඳුන්වනු ලබන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : හෙට්ටිවීදිය (පාර) සහ එම ඉඩමේම ලොට් 4 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 4 සහ පිඹුරු අංක 2074 හි ලොට් B ද, දකුණට : පිඹුරු අංක 2074 හි ලොට් B සහ එම ඉඩමේම ලොට් 2 සහ ලොට් 12 සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් 2 සහ හෙට්ටිවීදිය (පාර) ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම අටයි හත (අ. 0, රූ. 0, පර්. 21.87) ක ඉඩම සමග එයට අදාළ සියලු දේ ද වේ.

II වන කොටස - දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, වැලිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්වත්ත දරන ස්ථානයේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 1997.02.13 වැනි දින අංක 310 දරන පිඹුරේ ලොට් 15 ලෙස දැක්වෙන ආඩිගේවත්ත යන නමින් හඳුන්වනු ලබන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : එම ඉඩමේම ලොට් 19 (පාරක් සඳහා වෙන් කරන ලද) ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 16 ද. දකුණට : පොලාතුවැවවට මායිම්ව ඇති රක්ෂිතය සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් 14 යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දාසයයි දශම එකයි නමය (අ. 0, රූ. 0, පර්. 16.19)ක ඉඩම සමග එයට අදාළ සියලු දේ ද වේ.

ඒ සමගම ඉහත කී ආඩිගේවත්ත දරන ඉඩමෙන් පිඹුරු අංක 310 පරිදි මැන බෙදා වෙන් කරන ලද ලොට් 19 දරන, ඉහත කී පරිදි පොල්වත්ත දරන ස්ථානයේ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි පහයි දශම දෙකයි එක (අ. 0, රූ. 0, පර්. 25.21)ක දරන ඉඩම මතින් මාර්ග අයිතිය ද වේ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ පරිශ්‍රයට දැනට සහ මින් මතුවට සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියලුම නිශ්චල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇමුණුම් ද ඇතුළු ව විදුලිය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, ජලය සැපයීමේ පද්ධතිය සමග උපකරණද, විදුලි සංදේශ පද්ධතිය සමග උපකරණ සහ වායු සමීකරන පද්ධතිය ද වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10 - 830/1

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගැණුනු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015ක් වූ මාර්තු මස 23 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් වර්ෂ 2011.08.08 දිනැති අංක 2011/GAL/TLF/2100/76 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, වැලිගම දරන ස්ථානයේ වියන මැරීන් යන නාමය විලාශය සහ ආයතනය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන වැලිගම දරන ස්ථානයේ පදිංචි කලුහැන්නැදිගේ නිහාල් නන්දන ද සිල්වා (ණයට ගන්නා) විසින් පැහැර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2015ක් වූ ජනවාරි මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් දෙලක්ෂ විසිතුන්දහස් එකසිය දහනවයයි ශත අසූ එක (රු. 2,23,119.81) ක මුදලක් අයවිය යුතුය හා ණයව පවතින බැවින් ද,

සංශෝධිත 1990 අංක 4 දරන බැකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් දෙලක්ෂ විසිතුන්දහස් එකසිය දහනවයයි ශත අසූ එක (රු. 2,23,119.81) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2015 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් එක් ලක්ෂ අසූහයදහස් හයයි ශත හැත්තෑව (රු. 1,86,006.70)ක මුල් මුදල මත වසරකට සියයට දාසයයි දශම පහ (16.5%)ක පොළිය ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන චංචල දේපළ බලයලත් වෙන්දේසිකරු වූ පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

ධීවර නෞකාව 1 - ධීවර යාත්‍රාවේ දිග අඩි 40.03, බීම් - අඩි 12.02, ගැඹුර අඩි 07.03, ඩිසයින්ඩ් ඩ්‍රාෆ්ට් - අඩි 04.00, යාත්‍රාවේ වර්ගය මල්ටිඩේ යාත්‍රාව, එන්ජින් අංක 00969 (0437), වර්ගය යන්මාර්, හෝර්ස් පවර් - 39 HP, බෝට්යාඩ් අංකය BSM/40V/48, යාත්‍රාවේ හල් උපරකණය සෑදීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය - ෆයිබර් ග්ලාස්, හඳුනාගැනීමේ/ලියාපදිංචි අංක IMUL-A-0579-MTR, පළමු ලියාපදිංචි කිරීමේ දිනය 2001.04.02.

ධීවර නෞකාව 2 - ධීවර යාත්‍රාවේ දිග අඩි 40.06, බීම් - අඩි 13.06, ගැඹුර අඩි 07.09, ඩිසයින්ඩ් ඩ්‍රාෆ්ට් - අඩි 03.08, යාත්‍රාවේ වර්ගය මල්ටිඩේ යාත්‍රාව, එන්ඩින් අංක 341612, වර්ගය ලේලන්ඩ්, හෝර්ස් පවර් - 57HP, බෝට්යාඩ් අංකය SLB-313, යාත්‍රාවේ හල් උපරකණය සෑදීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය - ෆයිබර් ග්ලාස්, හඳුනාගැනීමේ/ලියාපදිංචි අංකය IMUL-A-0577-MTR, පළමු ලියාපදිංචි කිරීමේ දිනය 2006.10.11.

ඉහත උකස් කරන ලද චංචල දේපළ සහ එයට අදාළ සෑම දේ දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාව තුළ මාතර, මිරිස්ස, මිරිස්ස වරාය සංකීර්ණය තුළ තබා හෝ ගබඩා කර හෝ නවතා ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10 - 830/2

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015ක් වූ පෙබරවාරි මස 13 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් දිල්මිණි කේ. සමරතුංග මහත්මිය විසින් සහතික කරන ලද වර්ෂ 2013.04.24 දිනැති අංක 1224 සහ වර්ෂ 2014.04.01 වැනි දින අංක 1356 දරන උකස් බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ගම්පොළ දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ සමාගම් නීති යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන " ලක්හිල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" සහ ගම්පොල දරන ස්ථානයේ පදිංචි කෝරලේගෙදර මාලා රූපසිංහ (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද මාලා රූපසිංහ යන අය මෙහි පහත විස්තර කර ඇති දේපළේ සහ පරිශ්‍රයේ නිදහස් අයිතිකරු සහ ණයට ගන්නා හි සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂක වන අතර ණයට ගන්නා කෙරෙහි මනා සහ සෑහෙන සම්බන්ධතාවයක් ඇති අතරම ඇය විසින් සිය නිදහස් අයිතිවාසිකම් සහ බලපුළුවන්කාරකම් එකී බැඳුම්කර මගින් බැංකුවට උකස්කර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2015ක් වූ ජනවාරි මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් එක්කෝටි අසූ දෙලක්ෂ තිස් නම දහස් නමසිය පනස් හතරයි ශත හැත්තෑ පහ (රු. 1,82,39,954.75) ක මුදලක් අයවිය යුතුය හා ණයව පවතින බැවින් ද,

සංශෝධිත 1990 අංක 4 දරන බැකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් එක්කෝටි අසූ දෙලක්ෂ තිස් නම දහස් නමසිය පනස් හතරයි ශත හැත්තෑ පහ (රු. 1,82,39,954.75) ක මුදල සහ විකිණීම කරන අවස්ථාවවන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2015 පෙරවාරි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි පනස් ලක්ෂය (රු. 1,50,00,000.00)ක මුදල මත වසරකට සියයට විසි එකයි දශම පහ (21.5%)ක පොළිය ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුළුව නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු වූ පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

#### උගස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, උඩපළාත ගඟ පහල කෝරළේ අංක 1110 ඉල්ලවතුර ග්‍රාමසේවා නිලධාරි කොට්ටාසය තුළ ගම්පොල මහනගර සභා සීමාවේ කොට්ඨාස අංක 4 හිල් වීදියෙහි පිහිටි වරිපනම් අංක 9 සහ 9A දරන උඩුවලගෙදර වත්ත යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. එම්. පී. බී. රඹුක්වැල්ල විසින් මැන සාදන ලද වර්ෂ 2004.08.10 වැනි දින අංක 1461A දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කල ලොට් A දරන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : උනන්තැන්න සහ අනෙකුත් අයට අයත් ඉඩම්වලින් ද, නැගෙනහිරට : වරිපනම් අංක 11 සහ 13 හිල් වීදිය දරන උඩුවලගෙදර වත්තෙන් ද, දකුණට : හිල් වීදිය වෙන් කෙරෙන සිමෙන්ති කාණුවෙන් සහ බටහිරට : වරිපනම් අංක 7 හිල් වීදිය දරන ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම තුනයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.30) ක ඉඩම සමග ඒ තුළ පිහිටා ඇති වරිපනම් අංක 9 සහ 9A හි හිල් වීදිය දරන පරිශ්‍රය ද ඇතුළුව ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගස් කොළන් සහ එයට සම්බන්ධ සෑම සහ සියලු දේද වේ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ පරිශ්‍රයට දැනට සහ මින් මතුවට සවි වී හෝ සවි කර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියළුම නිශ්චල සහ චංචල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇමුණුම් ද ඇතුළුව විදුලිය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, ජලය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, විදුලි සංදේශ පද්ධතිය සමග උපකරණ සහ වායු සමීකරණ පද්ධතිය ද වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10 - 831

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1440003276.
ණය ගිණුම් අංක : 1548944

2015.03.30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2010 ඔක්තෝබර් මස 14 වැනි දින සහතික කරන ලද අංක 4210 සහ 2011 අගෝස්තු මස 10 වැනි දින සහතික කරන ලද අංක 4379 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. පී. පෙරේරා විසින් 2012 අගෝස්තු මස 13 වැනි දින සහතික කරන ලද අංක 1721 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නිශ්ශංක ආරච්චිගේ දයාශාන්ත ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරුවන් යටතේ රුපියල් කෝටි දෙක (රු. 2,00,00,000)ක මුදලක් 2015 පෙබරවාරි මස 15 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් කෝටි දෙක (රු. 2,00,00,000)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 පෙබරවාරි මස 16 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 2,00,00,000ක මුදල මත 24%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 4210, 4379 සහ 1721 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි

උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩ්‍රොප් වීදියේ අංක 200 දරන ස්ථානයේ 2 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### ඉහත සඳහන් කළ උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කූරු කෝරළයේ, රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 223 අකරවිට ග්‍රාම නිලධාරි වසමේ අකරවිට ගමේ පිහිටි අටුවේකනත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ජේ. පෙරේරා විසින් 2007 දෙසැම්බර් මස 26 වැනි දින සාදන ලද අංක 2145 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ප්‍රධාන මාර්ගයෙන් ද, නැගෙනහිරට : සේපාලට අයිති ඉඩමෙන් ද, දකුණට : ඇල සහ ඇලේ බෑවුමෙන් ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් 1992 පෙබරවාරි මස 13 වැනි දින සාදන ලද අංක 2854 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1හි ඉතිරි කොටසෙන් මායිම් වූ එකී අංක 2145 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් තිස්එකයි දශම පහයි අට (අ. 0, රූ. 1, පර්. 31.58)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

10 - 872

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - තංගල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ප්‍රදීප් නිරෝෂන් ජයරත්න

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.08.26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

එනම්, ප්‍රදීප් නිරෝෂන් ජයරත්න විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.07.19 දිනැති අංක 13811 දරන සහ වර්ෂ 2013.07.19 දිනැති අංක 13813 දරන ප්‍රාථමික උකස් බැඳුම්කර මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 13811 සහ 13813 දරන උකස් බැඳුම්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2015.06.07 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද වශයෙන් රුපියල් අසූ එක් ලක්ෂ පනස් තුන් දහස් එකසිය පනස් හයයි ශත පනස් පහ (රු. 81,53,156.55) ක මුදල සහ 2015.06.08 වැනි දින සිට රුපියල් හැත්තෑ දෙලක්ෂ හාරදහස් හත්සිය හැට එකයි ශත තිස් තුන (රු. 72,04,761.33)ක මුදල මත වාර්ෂිකව 16.5% බැගින් පොළිය ද සහ 2015.06.07 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැට හතර ලක්ෂ දහතුන් දහස් අටසිය එකොළහයි ශත අසූ නවය (රු. 64,13,811.89)ක මුදල සහ 2015.06.08 වැනි දින සිට රුපියල් පනස් නව ලක්ෂ පහළොස් දහස් තුන්සිය අනූ එකයි ශත තිස් හත (රු. 59,15,391.37)ක මුදල මත වාර්ෂිකව 12.13%ක බැගින් පොළිය ද පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්, එකී අංක 13811 සහ 13813 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් එකසිය හතළිස් පන් ලක්ෂ හැට හය දහස් නවසිය හැට අටයි ශත හතළිස් හතර (රු. 1,45,66,968.44)ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 180/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙසය.

### ඉහත සඳහන් උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවාපත්තු දකුණේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නෙතොල්පිටිය, තංගල්ල ප්‍රදේශීය සභාවේ, රන්න-බටහිර ග්‍රාම නිලධාරි සීමාව ඇතුළත, රන්න ග්‍රාමයේ පිහිටා ඇති මීගහකොරටුව නැමැති ඉඩමට බලයලත් මානක එච්. සිරිබද්ධන විසින් මැන සාදන ලද වර්ෂ 2010.11.25 දිනැති අංක 4539 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 2හි 2B දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 2A ද, නැගෙනහිරට : අංක 1641/A දරන පිඹුරේ ලොට් 3 ද, දකුණට : වීරකැටියේ සිට රන්න දක්වා ප්‍රධාන පාර ද සහ බස්නාහිරට : 1641/A දරන පිඹුරේ ලොට් 1 සහ අංක 557/A දරන පිඹුරේ ලොට් 1 ද මායිම් වූ, පර්චස් දහතුනක් වන (අ. 0, රූ. 0, පර්. 13) ක් වන ඉඩම සහ ඒ මත වූ ගහකොළ, වැව්ලි සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ. මෙම ඉඩම තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 06/49 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - අයකර ගැනීම්.

10 - 918

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හලාවත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පොන්නම්පෙරුමගේ රෝයි දිනේෂ් ප්‍රනාන්දු සහ පොන්නම්පෙරුමගේ ජෝසෆ් රන්ජන් ප්‍රනාන්දු.

2015 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද 2011 දෙසැම්බර් මස 22 වැනි දින සහතික කළ අංක 3765 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පොන්නම්පෙරුමගේ රෝයි දිනේශ් ප්‍රනාන්දු සහ පොන්නම්පෙරුමගේ ජෝසෆ් රන්ජන් ප්‍රනාන්දු ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑලක්ෂ දහදහස් දෙසිය හතරයි ශත හැත්තෑ පහ (රු.7,010,204.75) ක මුදලක් 2015 ජූලි මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් හැත්තෑ ලක්ෂ දහදහස් දෙසිය හතරයි ශත හැත්තෑ පහ (රු.7,010,204.75) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අගෝස්තු මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට 2011 දෙසැම්බර් මස 22 වැනි දින සහතික කළ එකී අංක 3765 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත සඳහන් කළ උපලේඛනය

වයඹ පළාතේ (හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ) පුත්තලම දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරලේ අණවිලුන්දන් පත්තුවේ මාදම්පේ- හලාවත ප්‍රාදේශීය සභා සීමාව තුළ දඳුරු ඔය ගමේ හි පිහිටි මිල්ලිසන්ට් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් 1997 ජූලි මස 28 වැනි දින සාදන ලද අංක 4637 දරන පිඹුරෙන් බෙද වෙන් කොට ඇති ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට අංක පි. පි. පුත් 2360 දරන පිඹුරේ ලොට් 14 සහ අංක පි. පි. පුත් 3570 දරන පිඹුරේ ලොට් 1 (පාර) ද, නැගෙනහිරට අංක පි. පි. පුත් 3570 දරන පිඹුරේ ලොට් 3 සහ පුත්තලම - හලාවත ප්‍රධාන මාර්ගයෙන් ද, දකුණට ලොට් 2න් ද සහ බස්නාහිරට අංක පි. පි. පුත් 2361 දරන පිඹුරේ ලොට් 30, 29, 28, 27 සහ 26 න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම හය (අ. 0, රූ. 1, පර්. 24.6) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය හලාවත දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු හලා 49/87 යටතේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීධරන් විසින් මෑතක දී කරන ලද මැනීමකින් පසු 2011 නොවැම්බර් මස 21 වැනි දින සාදන ලද අංක 5057 දරන පිඹුරේ මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර වේ.

වයඹ පළාතේ (නමුත් හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ) පුත්තලම දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරලේ අණවිලුන්දන් පත්තුවේ මාදම්පේ - හලාවත ප්‍රාදේශීය සභා සීමාව තුල දඳුරු ඔය ගමේ හි පිහිටි මිල්ලිසන්ට් වත්ත නැමති ඉඩමට අංක 5057 දරන පිඹුරෙන් බෙද වෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට සර්වේයර් ජනරල් විසින් මැන සාදන ලද අංක පී. පී. පුත් 2361 දරන පිඹුරේ ලොට් 26, 27, 28, 29, සහ 30 සහ ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට ප්‍රාදේශීය සභා පාර සහ හලාවත - පුත්තලම පාර ද (ආර්ඩීඒ), දකුණට හලාවත - පුත්තලම පාර (ආර්ඩීඒ) සහ බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් සාදන ලද අංක 4637 දරන පිඹුරේ ලොට් 2 න් ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් සාදන ලද අංක 4637 දන පිඹුරේ ලොට් 2 සහ සර්වේයර් ජෙනරල් විසින් මැන සාදන ලද අංක පි. පි. පුත්ත 2361 දරන පිඹුරේ ලොට් 26, 27, 28, 29, සහ 30 න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම හයයි බිංදුව (අ. 0, රූ. 1, පර්. 23.60) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

10-928/1

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොගවන්තලාව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පාන්ඩියන් වාසුදේවන්

2015 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනක් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූද 2011 අගෝස්තු මස 30 වැනි දින සහතික කළ අංක 2530 සහ 2013 දෙසැම්බර් මස 05 වැනි දින සහතික කළ අංක 3421 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පාන්ඩියන් වාසුදේවන් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දෙකෝටි පහළොස්ලක්ෂ එක් දහස් හයසිය හැටනමයයි ශත හැට එක (රු.21,501,669.61) ක මුදලක් 2015 ජූලි මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 21,501,669.61 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අගෝස්තු මස 01 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 2530 සහ 3421 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### පළවන උපලේඛනය

1. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් - දික්ඔය නගර සභා සීමාව තුළ හැටන් හි පිහිටි හැටන් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් 2006 ජූලි මස 07 වැනි දින සාදන ලද අංක 11934 දරන පිඹුරෙන් බෙද වෙන් කොට ඇති ලොට් 1ඒ දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 1143 දරන

පිඹුරේ ලොට් 1 සහ (ආර්ඩීඒ) පාරද, නැගෙනහිරට : (ආර්ඩීඒ) පාර සහ ලොට් 1 බී ද, දකුණට : අංක 1143 දරන පිඹුරේ ලොට් 1 බී සහ ලොට් 10 ද, බස්නාහිරට : අංක 1143 දරන පිඹුරේ ලොට් 10 සහ අංක 1143 දරන පිඹුරේ ලොට් 1 න්ද මායිම් වූ පර්චස් නමය (අ. 0, රූ. 0, පර්. 9) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

2. මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරලේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් - දික්ඔය නගර සභා සීමාව තුළ හැටන් හි පිහිටි හැටන් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් 2006 ජූලි මස 7 වැනි දින සාදන ලද අංක 11934 දරන පිඹුරෙන් බෙද වෙන් කොට ඇති ලොට් 1බී දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 1 ඒ (ආර්ඩීඒ) පාර සහ අංක 6364 දරන පිඹුරේ ලොට් 2 ද, නැගෙනහිරට : අංක 6364 දරන පිඹුරේ ලොට් 2 ද, දකුණට : අංක 6364 දරන පිඹුරේ ලොට් 2 සහ අංක 1143 දරන පිඹුරේ ලොට් 9 සහ ලොට් 10 ද, බස්නාහිරට : ලොට් 1A න් ද මායිම් වූ පර්චස් හය (අ. 0, රූ. 0, පර්. 6)ක විශාලත්වයෙන් වූ ඉඩම මග ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

### දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නගර සභා සීමාව තුළ බහිරවකන්ද 236 ග්‍රාම නිලධාරි වසමේ යටිනුවර ගඟවට කෝරළේ හි පිහිටි බහිරවකන්ද නැමති ඉඩමේ කොටසක් වන නිකමදිත්තේ හේන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් "1956 සැප්තැම්බර් මස 25 වැනි දින සහ 1956 ඔක්තෝබර් මස 01 වැනි දින සාදන ලද අංක 4035 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : කැබලි අංක 04 ද, ඊසානට : කැබලි අංක 01 ද, ගිණිකොණට සහ නිරිතට : අඩි විස්සක් පළල පාර ද, වයඹට : කැබලි අංක 05න් ද මායිම් වූ පර්චස් විසිහයයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 26.70) ක විශාලත්වයෙන් වූ නිවස සහ එහි පිහිටි සියලුම දේත් සමග වන අතර අනිවත්ත බහිරවකන්ද අඩි පාරේ දැන් 16 වන පටුමගේ වරිපනම් අංක 78 සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 374/264 යටතේ ලියාපදිංචි වී ඇත.

මැතකදී සාදන ලද පිඹුරක මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නගර සභා සීමාව තුළ බහිරවකන්ද 236 ග්‍රාම නිලධාරි වසමේ අනිවත්ත හි පිහිටි බහිවරකන්ද අඩි පාරේ හි වරිපනම් අංක 78 දැන් වරිපනම් අංක 16 දරන නිකමදිත්තේ හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් 1986 මාර්තු මස 11 වැනි දින සාදන ලද අංක 1731 දරන පිඹුරෙන් බෙදාවෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට : කලින් අංක $4035^2$ දරන පිඹුරේ ලොට් 1.,බහිරවකන්ද අඩි පාරේ වරිපනම් අංක 74 දරන පරිශ්‍රයෙන් ද, දකුණට සහ නිරිතට : බහිරවකන්ද අඩි පාර ද, වයඹට : කලින් අංක $4035^2$ දරන පිඹුරේ ලොට් 04 සහ 05, බහිරවකන්ද අඩි පාරේ හි වරිපනම් අංක 80/17 දරන පරිශ්‍රයෙන් ද මායිම් වූ පර්චස් විසි හත (අ. 0, රූ. 0, පර්. 27) හෙවත් හෙක්ටයාර 0.0682884 විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මැතකදී සාදන ලද පිඹුරක මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කොට්ඨාස අංක 05 දරන ගඟවට කෝරළේ සහ කඩවත් සතරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර නගර සභා සීමාව තුළ බහිරවකන්ද 236 ග්‍රාම නිලධාරි වසමේ (කලින් සඳහන් ඇති අනිවත්ත) හි පිහිටි බහිවරකන්ද (කලින් අංක 78 බහිරවකන්ද අඩි පාර) වීදිය, බණ්ඩාර පටුමගේ වරිපනම් අංක 16 දරන නිකමදිත්තේ හේන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් 2013 සැප්තැම්බර් මස 05 වැනි දින සාදන ලද අංක 5229 දරන පිඹුරෙන් බෙදාවෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට : වරිපනම් අංක 14 වීදිය බණ්ඩාර පටුමග ද (කලින් අංක 78 දරන බහිරවකන්ද අඩි පාර), දකුණට සහ නිරිතට : වීදිය, බණ්ඩාර පටුමග ද, වයඹට : වරිපනම් අංක 18 වීදිය බණ්ඩාර පටුමග ද (කලින් අංක 80/17 දරන බහිරවකන්ද අඩි පාර) මායිම් වූ පර්චස් විසි හයයි දශම අටයි නමය (අ. 0, රූ. 0, පර්. 26.89) හෙවත් හෙක්ටයාර 0.0680 විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

10-928/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.